යම් ආබාධ සහිතව සමාජයේ ජීවත් වන අය කිසිදු ආකාරයකින් සමාජය තුළ කොන් වීම හෝ වෙනස් ලෙසකින් සැලකුම් ලැබීම වැළැක්වීම උදෙසා, ඔවුන්ව හැඳින්වීමට වඩාත් යෝග්‍ය භාෂාවක් භාවිතා කිරීමේ වැදගත්කම, Ethics Eye අපි දිගින් දිගටම පෙන්වා දී ඇත්තෙමු. එහිදී අප අවධානයට ලක් කොට ඇත්තේ, යම් අයෙකු ආබාධයක් සහිතව ජීවත් වන බව පුවතකට අදාළ නම්, එම පුද්ගලයා "ආබාධිත පුද්ගලයෙකු (A disabled person)" ලෙසින් නොහඳුන්වා ඒ වෙනුවට එම පුද්ගලයා "ආබාධ සහිත පුද්ගලයෙකු (A person with a disability)" ලෙසින් හැඳින්වීම වඩාත් යෝග්‍ය නොවන්නේ ද යන්නයි. එය 'පුද්ගල-ප්‍රථම භාෂාවක්' (Person-first language) ලෙසින් හැඳින්විය හැක.

තවමත් ඇතැම් මාධ්‍ය ආබාධ සහිත වූවන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී පුද්ගල ප්‍රථම භාෂාවක් දක්වා ඉදිරියට ගොස් නොතිබුණත්, තවත් මාධ්‍ය ඒ සඳහා උත්සුක වීම සැබවින්ම ප්‍රශංසා කටයුතු වෙයි.

ඒ අනුව, පහත පුවත් වාර්තාවන්ගෙන්, ඔබ තෝරාගන්නේ කුමක්ද?

1) "ආබාධිත වසන්ත කෘතිම කකුලක් ලබා ගැනීමට උදවු ඉල්ලයි" - දිවයින (ජනවාරි 28, 2022)
2) "ආබාධ සහිතවූවන්ට ලෝරන්ස් මාදිවලගෙන් වියළි සලාක" - මව්බිම (ජනවාරි 28, 2022)